මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 අප්‍රේල් මස 04 දින |

# ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ රජය විසින් දේශීය බැංකු මගින් ලබාගත් විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ණය සඳහා සිදු කළ යුතු ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ සාවද්‍ය පුවත්පත් වාර්තාව

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ රජය විසින් දේශීය බැංකු මගින් ලබාගත් විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ණය සඳහා ආපසු ගෙවිය යුතු මුදල් පියවීම සැලසුම් සහගතව ප්‍රමාද කිරීම පිළිබඳ සාවද්‍ය සහ සනාථ නොකළ වාර්තාවක් අද එක්තරා පුවත්පතක් ප්‍රකාශයට පත් කොට ඇති බව මහ බැංකුව විසින් කණස්සල්ලෙන් යුතුව නිරීක්ෂණය කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ රජය විසින් දේශීය බැංකු මගින් ලබාගත් විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ණය වෙනුවෙන් සිදු කළ යුතු ණය සේවාකරණ ගෙවීම්, පොළී සහ ණය වාරික, මෙන්ම අනෙකුත් රජයේ ණය වගකීම් නියමිත පරිදි සිදු කරනු ලබන බවට ආයෝජකයින් සහ පොදු මහජනතාව වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනුම් දෙනු ලැබේ. එම පුවත්පතෙහි සඳහන් වූ පරිදි අදාළ ගෙවීම් පමා කිරීම හෝ කල්දැමීම සඳහා කිසිම සැලසුමක් නොමැති බැවින්, එම පුවත්පත් වාර්තාව මුළුමනින්ම සාවද්‍ය සහ පදනම් විරහිත අන්තර්ගතයකින් සමන්විත එකකි. කල් පිරෙන ණය ගෙවීම් පමා කිරීම තුළින් රජයේ නොකැලැල් ණය සේවාකරණ වාර්තාව විනාශ වී යාමට ඉඩ දීමට රජයේ කිසිදු අදහසක් නොමැත. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ රජය විසින් දේශීය බැංකු මගින් ලබාගත් විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ණය සම්බන්ධයෙන් 2021 වසරේ මේ දක්වා කාල සීමාව තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,200 කට ආසන්න ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණයක් දැනටමත් සිදු කර ඇති අතර ඉදිරියේ දී සිදු කිරීමට නියමිත ණය සේවාකරණ වගකීම් සියල්ල කිසිම පමාවකින් තොරව නිසි පරිදි සිදුකෙරෙනු ඇත.

මෙම පදනම් විරහිත සහ සාවද්‍ය පුවත්පත් වාර්තා පිළිනොගෙන බැහැර කරන ලෙසට ආයෝජකයින් සහ පොදු මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.